**ගොවිජන සංවර්ධන අරමුදල - 2017**

---

ගොවිජන සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 97(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 අභිතකර මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිත 1 හි 7 ඡේදය ප්‍රකාරව, ආදායම්, වියදම් හා වත්කම්, බැරකම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතු වුවද එයට පටහැනිව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අක්කර බදු ආදායම මුදල් පදනමට ගිණුම්ගත කරන බව දක්වා තිබුණි.

(ආ) ප්‍රමිත 9 හි 47 ඡේදය ප්‍රකාරව තොග අගය කිරීමේ පදනම හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේදී ගොවීන් වෙත ලබා දී තිබුණු ජල පොම්ප 140 ක් සහ ට්‍රැක්ටර් 2464 ක් සඳහා අය විය යුතු ණය වාරික උපචිත පදනම මත ගිණුම් නොතැබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබූ රු.181,163,484 හිඟ ණය වාරික මුදලක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) යථෝක්ත (අ) ඡේදයේ දක්වා ඇති අඩුපාඩුව හේතුවෙන් ගොවීන්ගෙන් අය කරනු ලබන ණය වාරික අරමුදලේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේදී එලෙස ආදායම් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර තිබුණු ණය වාරිකවල වටිනාකම රු. 20,296,143 ක් සහ රු. 17,159,610 ක් වූ අතර, එම වර්ෂවල අතිරික්තය එම වටිනාකම්වලින් අධිගණනය වී තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

---

අරමුදලේ මුදල් ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව මුදල් ශේෂය අතර 2008 වර්ෂයේ සිට පැවත එන රු. 651,798 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත 2010 වර්ෂයේදී ලබාදී තිබුණු රෝද 02 ට්‍රැක්ටර් ට්‍රේලර් හා රෝද 04 ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා වර්ෂ 07 කාලයක සිට අයවිය යුතු රු.6,194,575 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වනාතවිල්ලුව පටකරෝපණ විද්‍යාගාරය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී අරමුදල විසින් නැවත අයකර ගැනීමේ පදනම මත ලබාදී තිබුණු රු.518,000 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, එය දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කමක් ලෙස පෙන්වා තිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ආ) වගන්තිය ප්‍රකාරව කාර්යය නිම කළ වහාම ලබා ගත් අත්තිකාරම් මුදල පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 08 කදී ලබා දී තිබූ එකතුව රු. 4,507,861 ක අත්තිකාරම් විගණික දිනය වූ 2018 ජූලි 04 දින වන විටත් පියවා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.50,009,002 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.54,228,626 ක් වීමෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,219,624 ක පිරිහීමක් නිරීක්ෂණය විය. අවසරපත්‍ර ගාස්තු ආදායම රු.2,374,781 කින් අඩුවීම, වෙනත් ලැබීම් රු.1,863,265 ක් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කළ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත්, අරමුදලින් සිදු කරනු ලබන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ඇස්තමේන්තුව අනුව නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීම සඳහා වර්ෂය තුල වෙන් කර තිබූ රු.6,000,000 ක් හා ගොවි බැංකුවල මූල්‍ය හා ණය ලේඛනවල සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා අවශ්‍ය උපකරණ සැපයීම සඳහා වෙන් කර තිබුණු රු.2,000,000 ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) අරමුදලේ අරමුණක් වූ පර්යේෂණ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවැය ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2006 වර්ෂයට පෙර හඳුනාගෙන තිබුණු රු. 450,000 ක තොග ඌනතාවයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල එම මුදල ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී සියයට 30 සිට සියයට 150 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ)ගිණුම්කරණමය පාලනය | - හඳුනා ගැනීමකින් තොරව ගිණුම් ශේෂයන් අරමුදලට බැර කිරීම. |
| (ආ) ණය අයකර ගැනීම | - 2010 වර්ෂයේ සිට පැවත එන ණය වාරික අයකර නොගැනීම. |